මගේ අංකය
எனது இல.
My Number D2/QSIP/2025

ඔබේ අංකය
உமது இல.
Your Number

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
Department of Census and Statistics

දිනය
திகதி
Date 2025.10.03

.............................................
.............................................
.............................................

ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියනි,

**කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය - 2025**
**(තෙවන කාර්තුව ජූලි - සැප්තැම්බර්)**

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා අවශ්‍ය තත්කාලීන සංඛ්‍යාතීන් ලබාගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සිදු කරන කර්මාන්ත සමීක්ෂණයට අමතරව කාර්මික නිෂ්පාදන පිළිබඳ උපනතීන් හඳුනා ගැනීම සහ කර්මාන්ත අංශයේ දළ දේශීය නිෂ්පාදනය ගණනය කිරීම ආදිය අරමුණු කරගනිමින් කාර්මික නිෂ්පාදනය පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය පවත්වනු ලැබේ. විවිධ කර්මාන්ත අංශයන්ගෙන් සංඛ්‍යාන විද්‍යාත්මකව තෝරාගත් විශේෂ කර්මාන්ත ආයතනවලින් තොරතුරු රැස් කෙරෙන මෙම විශේෂ සමීක්ෂණය සඳහා ඔබ ආයතනය ද ඇතුළත්ව ඇති බව කාරුණිකව දැනුවත් කරමි. ඒ අනුව මීට ඉහතදීද, කාර්මික නිෂ්පාදන සමීක්ෂණ සඳහා දත්ත සැපයීමෙන් ඔබ ආයතනය විසින් දක්වන ලද සහයෝගය පිළිබඳව ස්තුතිවන්ත වෙමි.

02. ශ්‍රී ලංකාවේ කාර්මික නිෂ්පාදන පිළිබඳව 2025 වර්ෂයේ ජූලි සිට සැප්තැම්බර් දක්වා වන තෙවන කාර්තුව සඳහා දත්ත ලබා ගැනීමේ අරමුණින් සමීක්ෂණයේ මෙම වටය සිදු කරනු ලැබේ. ඒ අනුව කර්මාන්තවල නිෂ්පාදන, යෙදවුම් හා සේවා නියුක්තිය පිළිබඳ මූලික දත්ත එක්රැස් කිරීම සඳහා විශේෂයෙන් සකස් කරන කෙටි ප්‍රශ්නාවලියක් මේ සමඟ එවා ඇත.

03. ඒ අනුව ඔබ ආයතනයට අදාළව මේ සමඟ එවා ඇති ප්‍රශ්නාවලිය සම්පූර්ණ කර එය 2025 නොවැම්බර් මස 14 දින හෝ ඊට පෙර අප වෙත යොමු කිරීමට කටයුතු කරන්න. ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීමේදී ඔබට යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වුවහොත් කරුණාකර දුරකථන අංක 011–2147065 මඟින් කර්මාන්ත, වෙළඳ හා සේවා අංශයේ අංශ ප්‍රධාන නියෝජ්‍ය අධ්‍යක්ෂ මංජුල ඒකනායක මහතා අමතන්න.

04. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංඛ්‍යාලේඛන ආඥා පනතේ දැක්වෙන විධිවිධාන යටතේ මෙම දත්ත රැස් කරනු ලබන අතර එම පනත ප්‍රකාරව ඔබ විසින් ලබා දෙන තොරතුරුවල සම්පූර්ණ රහස්‍යභාවය රැකීමට අප දෙපාර්තමේන්තුව නීත්‍යානුකූලව බැඳී සිටින බව කාරුණිකව දැනුවත් කරමි.

මේ සම්බන්ධයෙන් ඔබගේ සම්පූර්ණ සහයෝගය ලබා දී මෙරට කර්මාන්ත සංවර්ධනයට දායක වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තූතියි.

මෙයට විශ්වාසී,

K.M.D.S.D. Karunaratne
.............................................

කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්

306/71, Polduwa Rd, Battaramulla / PO Box 121 Battaramulla   +94-11-214-7000 / +94-11-214-7400   +94-11-214-7011   www.statistics.gov.lk